ශීර්ෂය 103 ආරක්ෂක අමාත්‍යාංශය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 103 - ආරක්ෂක අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආරක්ෂක අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 වන දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජුනි 30 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආරක්ෂක අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ආරක්ෂක අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ආරක්ෂක අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත.මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ආදායම් ලැබීම්

අමාත්‍යාංශයට අදාළ ආදායම් ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ආදායම් සංකේතාංක 20.03.06.00 – එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් රාජකාරි තුලින් ලද තථ්‍ය ආදායම ලෙස මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගය රු. මිලියන 3,116.89 ක් වුවත් එම ආදායම රැස්කරනු ලබන ශ්‍රී ලංකා යුද්ධ හමුදාව හා ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් පිළිවෙලින් 2025 ජනවාරි 31 දින හා 2025 පෙබරවාරි 08 දින ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව තථ්‍ය ආදායම රු. මිලියන 3,064.33 ක් වූයෙන් රු. මිලියන 52.56 ක වෙනසක් පැවතුණි.	භාණ්ඩාගාර මුද්‍රිත ප්‍රකාරව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව හා ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් භාණ්ඩාගාරයට බැර කර ඇති රු.මිලියන 3203.75 සහ ඉන් අඩුකරන ලද රු.මිලියන 86.86 ක ආපසු ගෙවීම ගැලපීමෙන් අනතුරුව බැර කරන ලද සත්‍ය ආදායම රු.මිලියන 3116.89 ක් ලෙස නිවැරදිව ඉදිරිපත් කරන ලද නමුත්, යුද්ධ හමුදාව විසින් ඉදිරිපත් කර ඇති ආදායම පිළිබඳ අගයන් අතර රු. මිලියන 52.56 ක වෙනසක් නිරීක්ෂණය වී ඇති බව.	වර්ෂයට අදාල නිවැරදි ආදායම නිශ්චිතව හදුනාගෙන මූල්‍ය ප්‍රකාශන තුලින් අනාවරණය කළ යුතුයි.

(ආ) තැන්පතු

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ තැන්පත් ගෙවීම් හා ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය ඉදිකිරීම් ව්‍යාපෘති ගිණුම්වල දැක්වෙන කොන්ත්‍රාත් රැඳවුම් මුදල රු. මිලියන 918.069 ක් වූ අතර ඉන් රු. මිලියන 129.9 ක් වසර 05 ට වැඩි හිමිකම් නොපෑ රැඳවුම් මුදල් විය. කොන්ත්‍රාත් රැඳවුම් මුදල් අදාළ කොන්ත්‍රාත්තුව අවසන් වී වසර දෙකක් සම්පූර්ණ වූ පසු හිමිකම් නොපෑවොත් ඉකුත් වූ තැන්පතු ලෙස සලකා මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව රාජ්‍ය ආදායමට බැර කළයුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි.	සමගාමී වෙනත් කොන්ත්‍රාත් සමග බැඳී ඇති ඇතැම් කොන්ත්‍රාත් වැඩ අවසන්කර නොතිබීම, කොන්ත්‍රාත් අවසන් වුවද අළුත්වැඩියාවන් පැවතීම හා භාරදීම් හා භාරගැනීම් නිසි පරිදි සිදු නොකිරීම, රැඳවුම් මුදල් නිදහස් කරන ලෙස ඉල්ලීම් ලැබී නොතිබීම වැනි කරුණු හේතුවෙන් රැඳවුම් මුදල් නිදහස් කිරීම ප්‍රමාදවී ඇති බව.	මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කොන්ත්‍රාත්තුව අවසන් වී වසර දෙකක් සම්පූර්ණ වූ පසු හිමිකම් නොපාන තැන්පතු රාජ්‍ය ආදායමට බැරකිරීමට කටයුතු කළ යුතුය.

(ඈ) **දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමණාකරණ චක්‍රලේඛයේ උපදෙස් අනුව රජයට අයත් සියළු ඉඩම් වටිනාකම තක්සේරු කර වාර්තා කල යුතු වුවද, ජාතික ශිෂ්‍ය භට බලකායට අයත් හෙක්ටයාර් 3.127 ක් වූ ඉඩම් කොටස් **3** ක වටිනාකම තක්සේරු කර ගිණුම් ගතකර නොතිබුණි.	මෙම ඉඩම් කොටස්වල තක්සේරු කටයුතු අවසන්වීමෙන් පසු ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව.	චක්‍රලේඛය පරිදි ඉඩම් හඳුනාගැනීම**,** තක්සේරු කිරීම හා වටිනාකම් ගිණුම්ගත කිරීමට අදාළ කටයුතු කළ යුතුය.
(ii)	ආරක්ෂක මුලස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතිය යටතේ 2022 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුළ ආරක්ෂක මුලස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතියේ මූලධන වියදම යටතේ වියදම්කර තිබූ ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම් (9152 -61122 - අනෙකුත් යාන්ත්‍රික උපකරණ) රු. 722,300,666 ක් සහ කෙරීගෙන යන වැඩ පිරිවැය (9160 – 61114) රු. 18,282,445,134 ක් ලෙස එකතුව රු. 19,004,745,800 ක් **SA** 82 මූල්‍ය නොවන වත්කම් වාර්තාවට ඇතුලත්ව නොතිබුණි.	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව ආරක්ෂක හමුදා මූලස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතියට අදාළ වත්කම් හඳුනාගෙන CIGAS පද්ධතියට ඇතුලත් කිරීම සිදු කරමින් පවතින අතර 2025 වර්ෂය අවසන් වීමට පෙර ගිණුම් සාරාංශ මගින් මෙම වත්කම් වාර්තා කිරීමට කටයුතු කරනු ලබන බව.	ආරක්ෂක මුලස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතියේ මූලධන වියදම් යටතේ ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම් සහ කෙරීගෙන යන වැඩ වටිනාකම නිවැරදිව මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කිරීමට කටයුතු කළ යුතුය.
(iii)	ආපදා කළමණාකරණ අංශයට පරිත්‍යාග වශයෙන් ලැබී නිශ්කාර්යව පැවති ජල බවුසර් 78 ක් වෙනත් ආයතන වෙත පවරාදී තිබුණු නමුත්, එම රථවල ගිණුම්ගත කළ පිරිවැය වූ රු. 40,170,000 ක් ගිණුම්වලින් ඉවත්කර නොතිබීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	වෙනත් රාජ්‍ය ආයතන වෙත පවරාදීමට කටයුතු කරනු ලැබූ ලොරි බවුසර් රථ සිගාස් පද්ධතියෙන් ඉවත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරනු ලබන බව.	වර්ෂයතුල සිදුකරනු ලබන අපහරණයන් ගිණුම මගින් ගැලපීමට කටයුතු කළ යුතුය.
(iv)	පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ ජල බවුසර් 191 ක ඒකක පිරිවැය ලෙස ඒ සඳහා ගෙවා තිබූ රේගු ගාස්තු රු.515,000 ක් පමණක් හඳුනාගෙන තිබුණු බැවින් මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම අඩුවෙන් ගිණුම්ගතවී තිබුණි.	ඉතිරිව පවතින වාහනවලට අදාළ නිවැරදි තක්සේරු වටිනාකම් සිගාස් පද්ධතියට ඇතුළත් කිරීමට කටයුතු සිදු කරමින් පවතින බව.	වත්කම්වල නිවැරදි තක්සේරු වටිනාකම් ගිණුම් තුලින් නිරූපනය විය යුතුය.

(ඇ) අත්තිකාරම් ගිණුම් ශේෂ

අත්තිකාරම් ගිණුම්වල වර්ෂය අවසානයට වූ ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2016 අගෝස්තු 03 දිනැති අංක 250/2016(**i**) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි වැඩ කොන්ත්‍රාත් සඳහා අත්තිකාරම් ගෙවීමේදී සිගාස් පද්ධතිය තුළ ගිණුම් පවත්වා ගත යුතු වුවත්, අමාත්‍යාංශය විසින් ආරක්ෂක මූලස්ථාන සංකීර්ණ ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාර්යයන් 24 කට අදාලව 2024 දෙසැම්බර් 31 දිනෙන් ඉදිරි කාලපරිච්ඡේදයන්ට අදාල රු. 159,720,255 ක වැඩ අත්තිකාරම් පැවති අතර චක්‍රලේඛ උපදෙස් පරිදි කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම හා කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම් මගින් අනාවරණය කර නොතිබුණි.	කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම් සකස් කිරීම සඳහා අදාළ ආකෘතිපත්‍ර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද අතර ආරක්ෂක හමුදා මූලස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා මෙවැනි ගිණුම් සකස් කිරීමේ හැකියාවක් නොමැති බව වාචිකව දැනුම් දෙන ලද බව.	ඉදිරි කාලපරිච්ඡේදයට අදාලව ගෙවීම් මත රජයට ඇති හිමිකම නිසි ලෙස පිළිබිඹුවන පරිදි වැඩ අත්තිකාරම් සංචිත ගිණුම් පවත්වාගත යුතුයි.
(ii)	2016 අගෝස්තු 03 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයෙහි අංක 250/2016 හා (3) සහ (4) ඡේද ප්‍රකාරව හා කුලී හා වැඩ සඳහා අත්තිකාරම් මුදල් ගෙවීමේදී, කුලි හා වැඩ අත්තිකාරම් ගිණුමක් සහ කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුමක් මගින් ගිණුම්ගත කළයුතු වුවත් ජාතික ආරක්ෂක විද්‍යායතනය විසින් කුලී ගොඩනැගිල්ලක් වෙනුවෙන් ගෙවා තිබුණු රු. 17,259,000 ක කුලී අත්තිකාරම ඉහත චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් ගතකර නොතිබුණි.	කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම් සකස් කිරීම සඳහා අදාළ ආකෘති පත්‍ර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද අතර ආරක්ෂක හමුදා මූලස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා මෙවැනි ගිණුම් සකස් කිරීමේ හැකියාවක් නොමැති බව වාචිකව දැනුම් දෙන ලද බව.	රජයට ඇති හිමිකම නිසි ලෙස පිළිබිඹුවන පරිදි කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම් පවත්වාගත යුතුයි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වර්ෂයේ මූලික ආදායම් ඇස්තමේන්තුව අනුව බලපත්‍ර ගාස්තු ආදායම රු.මිලියන 59 ක් වූ අතර සංශෝධිත ඇස්තමේන්තුව මගින් රු.මිලියන 55.44 ක් දක්වා අඩුකර තිබුණි. එහෙත් 2024 වර්ෂයේ තථ්‍ය ආදායම රු.මිලියන 80.40 ක් වූයෙන් තථ්‍ය ආදායම සංශෝධිත ඇස්තමේන්තුව මෙන් සියයට 145 ක වැඩිවීමක් සහිත විය. එබැවින් ආදායම් ඇස්තමේන්තු තාත්විකව පිළියෙල කර නොතිබුණි.	2015 ජූලි 22 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 3 ඡේදයේ සඳහන් කරුණුද සැලකිල්ලට ගනිමින් නිවැරදි ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට හැකිවන පරිද්දෙන් තාත්විකව ආදායම් ඇස්තමේන්තුව පිළියෙල කර එවන ලෙසට සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත දැනුම් දෙන ලද බව.	නිවැරදි ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට හැකිවන පරිද්දෙන් තාත්විකව ආදායම් ඇස්තමේන්තු පිළියෙල කළයුතුය.
(ආ)	ආදායම් සංකේතාංක අංක 20.03.06.00 - එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් තුලින් ලද ආදායමට අදාල මූලික ආදායම් ඇස්තමේන්තුව රු. මිලියන 5,300 ක් ද, සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු. මිලියන 3,127.74 ක්ද වූයෙන් රු.මිලියන 2,172.26 ක හෙවත් මූලික ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 41 ක අඩුවීමක් දැක්වුණි. මෙලෙස ආදායම් ඇස්තමේන්තුවල සිදුවන විචලනයන්ට හේතු අනාවරණය වන පරිදි තක්සේරු කළ ආදායම හා උපකරණ සැපයීමට නොහැකිවීම ආදිය හේතුවෙන් අහිමිවන ආදායම හා වෙනත් අඩුකිරීම් ආදිය හඳුනාගත හැකිවන පරිදි ලේඛණ පවත්වා ගැනීමක් අමාත්‍යාංශය විසින් සිදුකර නොතිබුණි.	අදාල ආයතන සමග ඇතිකර ගනු ලැබූ ගිවිසුම්ගත එකගතාවයන් අනුව තක්සේරු කළ ආදායම හා එම එකඟතාවයන් ඉටු නොකිරීම මත අහිමිවන ආදායම හා වෙනත් අඩු කිරීම් ආදිය හඳුනාගත හැකි වන පරිදි අදාල ලේඛණ 2025 වර්ෂයේ සිට ඉදිරියේදී පවත්වාගෙන යාමට කටයුතු කරන බව.	තක්සේරු කළ ආදායම, අහිමිවන ආදායම් හා වෙනත් අඩු කිරීම් ආදිය හඳුනාගත හැකි වන පරිදි ලේඛණ පවත්වා ගත යුතුය.
(ඇ)	2024 වර්ෂයේ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබූ ආදායම් ශීර්ෂ අංක 20.03.06.00 - එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් තුලින් රැස්කර ගැනීමට ඇස්තමේන්තු කර තිබූ මූලික ආදායම් ඇස්තමේන්තුව රු. මිලියන 5,300 ක් වූ අතර සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු. මිලියන 3,127.74 ක් විය. ඒ අනුව රු.මිලියන 2,172.26 ක් හෙවත් මූලික ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 41 ක වෙනසක් (අඩුවිම) නිරීක්ෂණය විය. මෙලෙස ආදායම් ඇස්තමේන්තුවල සිදුවන සැලකියයුතු විචලනයන්ට බලපෑ හේතු අනාවරණය කර ගැනීමට හැකිවන පරිදි ලේඛණ පවත්වා ගන්නා බවට තහවුරු නොවුණි.	අදාල ආයතන සමග ඇතිකර ගනු ලැබූ ගිවිසුම්ගත එකගතාවයන් අනුව තක්සේරු කළ ආදායම හා එම එකඟතාවයන් ඉටු නොකිරීම මත අහිමිවන ආදායම හා වෙනත් අඩු කිරීම් ආදිය හඳුනාගත හැකි වන පරිදි අදාල ලේඛණ 2025 වර්ෂයේ සිට ඉදිරියේදී පවත්වාගෙන යාමට කටයුතු කරන බව.	තක්සේරු කළ ආදායම, අහිමිවන ආදායම් හා වෙනත් අඩු කිරීම් ආදිය හඳුනාගත හැකි වන පරිදි ලේඛණ පවත්වා ගත යුතුය.

3.2 වියදම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය		ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පුනරාවර්තන හා මූලධන වියදම් වැය විෂයන් 20 කට අදාලව සලසාගෙන තිබුණු රු. මිලියන 239.61 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 3.15 ක් මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයයන්ට මාරු කිරීම හැර වෙනත් කිසිදු වියදමක් දරා නොතිබූ බැවින් සියයට සීයක් ඉතිරිව තිබුණි.	ආරක්ෂක අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලයක් අනුයුක්ත නොවීම, නව ගොඩනැගිල්ල සඳහා අළුත්වැඩියා වියදම් සීමා වීම, වියදම් සීමා කිරීම, ප්‍රසම්පාදන කටයුතු සිදු නොවීම, ශිෂ්‍යභට බලකායේ සක්‍රිය සේවයට වාර්තා කිරීමේදී ගෙවනු ලබන වැටුප් අතර පරතරය අඩුවීම, අයහපත් කාලගුණික තත්ත්වය මත පුහුණු කඳවුරු නොපැවැත්වීම, අක්මුදල් නිදහස් නොකිරීම, ආපදා අවම කිරීම් ව්‍යාපෘති නිම කිරීමට නොහැකි වීම, කැබිනට් පත්‍රිකා අනුමත කිරීම ප්‍රමාද වීම මත කොන්ත්‍රාත්තු ප්‍රධානය කිරීම ප්‍රමාද වීම ආදී කරණු මේ සඳහා බලපා ඇති බව.	මුදල් රෙගුලාසි 3 හා 4 ප්‍රකාරව ඇස්තමේන්තු සැකසීමේදී හා අනුමත මුදල් උපයෝජනයේදී මුදල් වර්ෂය තුල ඉටුකරගත හැකි වැඩසටහන් වලට සීමා කරන බවට සහතික විය යුතුය.
(ආ)	මූලධන හා පුනරාවර්තන වැය විෂයයන් 45 කට සලසා තිබුණු රු. මිලියන 10,921.00 ක ප්‍රතිපාදනයෙන් රු. මිලියන 7,436.17 ක ප්‍රතිපාදන ඉතිරිව පැවති අතර එම ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 50 ත් සියයට 98 ත් අතර පරාසයක පැවතුණි.	කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම ප්‍රමාද වීම, ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කර ගැනීමට නොහැකි වීම, කොන්ත්‍රාත් බිල්පත් ඉදිරිපත්වීම ප්‍රමාද වීම, ආරක්ෂක අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලයක් අනුයුක්ත නොවීම, ආරක්ෂක අමාත්‍ය වරයාගේ ප්‍රාග්ධන වියදම් අවම වීම, වියදම් පාලනය කිරීම, අක්මුදල් නිදහස් නොකිරීම ආදී කරණු මේ සඳහා බලපා ඇති බව.	මුදල් රෙගුලාසි 3 හා 4 ප්‍රකාරව ඇස්තමේන්තු සැකසීමේදී හා අනුමත මුදල් උපයෝජනයේදී මුදල් වර්ෂය තුල ඉටුකර ගතහැකි වැඩසටහන් වලට සීමා කරන බවට සහතික විය යුතුය.
(ඇ)	තවත් වැය විෂයයන් 43 කට අදාලව සලසා තිබුණු රු. මිලියන 9,419.58 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 4,446.66 ක් ඉතිරිව පැවති අතර එය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සැලකිල්ලට ගත්විට සියයට 20 ත් සියයට 49 ත් අතර පරාසයක පැවතුණි.	අයහපත් කාලගුණික තත්ත්වය මත පුහුණු කඳවුරු නොපැවැත්වීම, ප්‍රසම්පාදන ක්‍රියාවලිය ගැටළු සහගත වීම, සැලසුම් කළ ආපදා අවම කිරීමේ ව්‍යාපෘති නිම කිරීමට නොහැකි වීම ආදී කරණු මේ සඳහා බලපා ඇති බව.	අනුමත කරනු ලබන අරමුදල්, මුදල් වර්ෂය තුල ඉටුකර ගත හැකි වැඩසටහන් වලට සීමා කරන බවට සහතික විය යුතුය.
(ඈ)	රු. මිලියන 81.2 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණු වැය විෂයයක් සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ රු. මිලියන 320 ක අතිරේක ප්‍රතිපාදන සලසාගෙන තිබුණු නමුත් එම අතිරේක ප්‍රතිපාදනයෙන් සියයට 86 ක් හෙවත් රු.මිලියන 277.05 ක ප්‍රතිපාදන ඉතිරිවී පැවතුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	වියදම් දැරීම සඳහා අතිරේකව සලසාගත් ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවකින් යුතුව උපයෝජනය කළ යුතුය.

3.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2025 වර්ෂයේ ජනවාරි සහ පෙබරවාරි මාසවල ගෙවීම් වවුචර් පිළිබඳ නියැදි පරීක්ෂාවකදි 2024 වර්ෂයට අදාළව අවස්ථා 50 කදී එකතුව රු. 4,626,545 ක් වූ වියදම් 2025 වර්ෂයේ ප්‍රතිපාදන වලින් වැයකර තිබුණු නමුත් එම වියදම් 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල බැරකම් ලෙස හදුනාගෙන නොතිබුණි. ඒ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල රු. 4,626,545 ක බැරකම් අඩුවෙන් දක්වා තිබුණි.	මෙවැනි වියදම් හදුනාගෙන බැදීම් හා බැරකම් ලේඛණ වලට ඇතුළත් කිරීම සඳහා අභ්‍යන්තර පාලන කුමවේදයක් ඇතිකර ගැනීමට උපදෙස් ලබාදුන් බව.	මුදල් රෙගුලාසි 94 (2) හි විධිවිධාන අනුව බැරකම් හදුනාගැනීමට කටයුතු කළ යුතුය.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නිරීක්ෂණය			ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම		
(i)	2022 සැප්තැම්බර් 09 දිනැති ජනාධිපති ලේකම්ගේ අංක PS/CSA/00/1/4/1 හා රාජ්‍ය වියදම් කළමනාකරණය මැයෙන් වූ ලිපියේ 3.1 ඡේදය.	-	රාජ්‍ය අමාත්‍යවරුන්/නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ පරිහරණය හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් වෙන්කරනු ලබන උපරිම නිල වාහන සංඛ්‍යාව 03 ක් ලෙස දක්වා ඇතත් , 2024 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ නියෝජ්‍ය අමාත්‍යවරයා වෙත අමාත්‍යාංශය විසින් වාහන තුනක් ද යුද්ධ හමුදාව විසින් එක් රථයක් ද වශයෙන් රථ 04 ක් සහ ඉන්ධන ලබාදී ඇති බව නිරීක්ෂණය විය.	අදාල රාජ්‍ය අමාත්‍යවරයාගේ අනුදැනුම පරිදි ආරක්ෂක කටයුතු සඳහා භාවිතා කර ඇතත්, අමාත්‍යවරයා විසින් පෞද්ගලිකව භාවිතා කර නොමැති බව.	රාජ්‍ය වියදම් කළමනාකරණය පිණිස පනවා ඇති රෙගුලාසීන් වලට අනුගතව කටයුතු කළ යුතුය.
(ii)	2016 ඔක්තෝබර් 04 දිනැති අමාත්‍ය මණ්ඩල තිරණය	රු. මිලියන 211.6	ආරක්ෂක මූලස්ථාන සංකීර්ණයේ අංක 06, අංක 07 හා අංක 08 දරන ගොඩනැගිලි කඩිනමින් නිමකර, දැනට කුලී පදනම මත පවත්වාගෙන යනු ලබන කාර්යාල පරිශ්‍ර එම ගොඩනැගිලි වල ස්ථානගත කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු බවට අමාත්‍යාංශ ලේකම් වරයාට නියමකර ඇතත්	2021 වර්ෂයේදී ආරක්ෂක අමාත්‍යාංශය හා කුලී ගොඩනැගිල්ලක පැවති කාර්යාල අංක 08 ගොඩනැගිල්ලේ ස්ථාපනය කළ අතර ආරක්ෂක	අමාත්‍ය මණ්ඩල තිරණයන් පරිදි කුලී ගොඩනැගිලිවල පවත්වාගෙන යන කාර්යාල පරිශ්‍ර ඉවත්

			ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය කුලියට ගත් ගොඩනැගිල්ලක පැවති අතර සමාලෝචිත වර්ෂයේ වාර්ෂික කුලිය රු. මිලියන 60.47 ක් විය. එහෙත් වර්ග මීටර් 19,000 ක් පමණ වූ මහල් 09 කින් සමන්විත අංක 08 දරන ගොඩනැඟිල්ල 2021 ජනවාරි මාසය වනවිට ඉදිකිරීම් අවසන්කර තිබුණද පූර්වොක්ත අමාත්‍ය මණ්ඩල තිරණය පරිදි කටයුතු නොකිරීම මත 2021 මැයි මාසයේ සිට 2024 නොවැම්බර් දක්වා ආසන්න වශයෙන් රු. මිලියන 211.6 ක් ගොඩනැගිලි කුළි වශයෙන් ගෙවා තිබුණි.	මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය සඳහා ඉඩකඩ නොපැවති බව .	කිරීමට කටයුතු කළ යුතුය.
(iii)	මුදල් රෙගුලාසි 104 (3)		පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින හතකට වැඩි ප්‍රමාදයක් වේ යැයි අපේක්ෂා කරන්නේනම් ප්‍රාරම්භක වාර්තාව වහාම ඉදිරිපත් කල යුතු වුවත්, ජාතික ශිෂ්‍යභට බලකායෙහි සිදුව තිබූ හානි පාඩු සම්බන්දයෙන් එලෙස ප්‍රාරම්භක වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07 කට වැඩි කාලයක් ගත් අවස්ථා 06 ක් පැවති බව නිරීක්ෂණය විය.	කඩිනමින් වාර්තා ඉදිරිපත් කිරීමට උපදෙස් ලබාදී ඇති බව.	මුදල් රෙගුලාසි 104 (3) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තා අප්‍රමාදව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුයි.
(iv)	මුදල් රෙගුලාසි 104 (4)	-	අලාභහානිය සිදුවූ දිනයේ සිට මාස 03 ක් ඇතුලත පූර්ණ වාර්තාව ඉදිරිපත් කල යුතු වුවත් ජාතික ශිෂ්‍යභට බලකායෙහි විගණනයට ඉදිරිපත් කල ලිපිගොනු 17 ක් පරීක්ෂා කිරීමේදී ඉන් අවස්ථා 13 කදීම පූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබූ බව අනාවරණය විය.	ශිෂ්‍යභට බලකායට අයත් බලඇණි දිවයිනේ විවිධ ප්‍රදේශවල ස්ථාපනය වී ඇති හෙයින් ප්‍රමාදයන් සිදුවී ඇති අතර කඩිනමින් සිදුකිරීමට උපදෙස් ලබාදී ඇති බව.	මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව පූර්ණ වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුයි.

(v)	භාණ්ඩාගාර ලේකම්ගේ 2022.06.02 දිනැති රාජ්‍ය වියදම් පාලනය කිරීම මැයෙන් ආරක්ෂක ලේකම් අමතනලද ලිපිය	-	පූර්වෝක්ත ලිපිය මගින් ත්‍රිවිධ හමුදාවේ හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිළධාරීන් සඳහා නිල වාහන අනුයුක්ත කිරීමේදී අනුමත හිමිකමට පමණක් වාහන භාවිතය සීමා කිරීම, නිල හිමිකම සහිත නිළධාරීන් සඳහා එක් වාහනයක් පමණක් වෙන්කිරීම ඇතුළු අධික ඉන්ධන වියදම් සීමා කිරීම සඳහා ක්‍රමවේද භාවිතා කළයුතු බව අවධාරණය කර ඇතත් අමාත්‍යාංශයට අනුයුක්ත හමුදා නිළධාරීන් විසින් නිත්‍ය සේවා ස්ථානයෙන් නිලවාහන සහ ඉන්ධන ලබාගෙන තිබියදී අමාත්‍යාංශයට අයත් වාහන හා ඉන්ධන භාවිතාකර තිබුණු අවස්ථා පැවති බව නියැදි පරීක්ෂාවලදී නිරීක්ෂණය විය.	අත්‍යාවශ්‍ය රාජකාරීන් සහ රටේ ආරක්ෂාව, ආපදා කළමනාකරණයේදී අත්‍යවශ්‍ය රාජකාරීන් ඉටු කිරීම සඳහා මෙම වාහන භාවිතා කර ඇති බව හා වාහන භාවිතය සීමා කිරීමට, ඉන්ධන සීමා කිරීමටත් උපරිමයෙන් කටයුතු කර ඇති බව.	රාජ්‍ය වියදම් පාලනය පිළිබඳ භාණ්ඩාගාර උපදෙස්වලට අනුගතව නිල වාහන හිමිකම සහිත නිළධාරීන් සඳහා එක් වාහනයක් පමණක් භාවිතා කළ යුතුය.
(vi)	2015 ජුලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 1/2015 හි (05) ඡේදයේ සහ මුදල් රෙගුලාසි 128 (2)(එ)	-	උක්ත විධිවිධානවලට අනුව, ආර්ථික තත්ත්වයේ වෙනස්කම් සැලකිල්ලට ගනිමින්, අවශ්‍ය විටෙක විවිධ සේවාවන් සඳහා අය කරනු ලබන ගාස්තු කාලෝචිත ලෙස සංශෝධනය කළ යුතු වුවත්, 1996 අංක 22 දරන තුවක්කු (සංශෝධන) පනත යටතේ අයකරනු ලබන ගාස්තු කාලීනව සංශෝධනය කිරීම තවදුරටත් ප්‍රමාද වෙමින් පැවතුණි. ක්‍රියාත්මක බදු ප්‍රමාණයන් සලකා බැලීමේදී ඉතාම අවම වාර්ෂික ගාස්තුවක් මත බලපත්‍ර නිකුත් කිරීම හා බලපත් අළුත් කිරීම ක්‍රියාත්මක වන බැවින් වර්ෂ 29 කට ආසන්න කාලයක් තුළ ගාස්තු සංශෝධනයකට ලක් නොකිරීම හේතුවෙන් සැලකිය යුතු රාජ්‍ය ආදායමක් වාර්ෂිකව අහිමිවන බවත් නිරීක්ෂණය විය.	1996 අංක 22 දරණ තුවක්කු (සංශෝධන) පනත මඟින් නියම කර ඇති බලපත්‍ර ගාස්තු සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, ඉදිරි කටයුතු සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත 2025.05.08 වන දින යොමුකර ඇත.	අප්‍රමාදව ගාස්තු සංශෝධනය කිරීම තුලින් ආදායම් අහිමිවීම වලක්වා ගැනීමට කටයුතු කළ යුතුය.

(vii)	තුවක්කු ආඥා පනතෙහි 182 අධිකාරියෙහි 22 (1) හා 29 (1) වගන්ති	-	යම් තැනැත්තෙකු විසින් තුවක්කුවක් තබා ගැනීමට හෝ සන්තකයේ තබා ගැනීමට හෝ පාවිච්චි කිරීමට බලපත්‍රයක් තිබිය යුතුය. 2024 දෙසැම්බර් 31 දිනට බලපත්‍ර අළුත් නොකල ගිනි අවි සංඛ්‍යාව 7,125 ක් විය. එසේම, තුවක්කු ආඥාපනතේ 182 අධිකාරයෙහි 29 (1) වගන්තිය අනුව බලපත්‍රයේ වලංගුභාවය අවසන්වී දින 10 ක් තුළ ඒ තුවක්කුව හා බලපත්‍රය බලපත්‍ර අධිකාරිවරයාට භාරදීමත් බලපත්‍ර අධිකාරිවරයා විසින් විධාන කරනු ලබන ස්ථානයක ඒ තුවක්කුව තැන්පත් කිරීමත් සිදුකළයුතු වුවත්. බලපත්‍ර අළුත් කරනු නොලැබූ ඉහත සඳහන් බලපත්‍ර 7,125 සම්බන්ධයෙන් ඉහත පරිදි කටයුතු සිදු කළ බව අනාවරණය නොවුණි.	වාර්ෂිකව අලුත් කර නොමැති ගිණි අවි හා එවායේ හිමිකරුවන් සම්බන්ධයෙන් පොලිස්පති වෙතින් ලද වාර්තාව සලකා බලා ඒ පිළිබඳව දිස්ත්‍රික් ලේකම්වරුන්ද දැනුවත් කොට ඉදිරි නීතිමය ක්‍රියාමාර්ග ගැනිමට දැනුවත් කළ බව හා ගිනිඅවි සම්බන්ධ තොරතුරු පද්ධතියක අවශ්‍යතාව හදුනාගෙන එහි මූලික අඩියර ක්‍රියාත්මක කරමින් පවතින බව.	බලපත්‍ර අළුත් නොකල ගිනි අවි සම්බන්ධයෙන් තුවක්කු ආඥාපනතේ 182 අධිකාරයෙහි 29 (1) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුයි.
(viii)	2017 ජූනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය	රු. 124,258,905	මිලදී ගන්නා හා අපහරණය කරනු ලබන වත්කම් සම්බන්ධයෙන් තොරතුරු අදාල කාර්තුව අවසානයේදී කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කල යුතු වුවද 2024 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු. 124,258,905 ක වත්කම් පිළිබඳ තොරතුරු විගණිත දිනය වන විටත් කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත යැවීමට කටයුතු කර නොතිබුණි.	ක්‍රොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය විසින් හඳුන්වා දී ඇති වාහන පිළිබඳ තොරතුරු පද්ධතියට අදාළ දත්තයන් ඇතුළත් කර ඇති අතර අනෙක් වත්කම් සම්බන්ධයෙන් පද්ධති ගොඩනැගී මෙන් අනතුරුව ක්‍රොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ උපදෙස් පරිදි යාවත්කාලින කිරිමට කටයුතු කරන බව.	වත්කම් කළමනාකරණ චක්‍රලේඛය පරිදි කටයුතු කර අදාල වාර්තා නියමිත කාලසීමාව තුළ ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය.

3.5 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අධිකාර බලය නොමැති ගෙවීම්

අමාත්‍යාංශය විසින් අධිකාරී බලය නොමැතිව පහත සඳහන් ගෙවීම් (ගණුදෙනු) කර තිබුණි.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අයත්/ කුලී පදනම මත ලබාගත් වාහන 11 ක් හා යතුරු පැදියක් ඉන්ධන සහිතව ආරක්ෂක අමාත්‍යාංශය වෙත පරිහරණය සඳහා මුදාහැර ඇති බව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් විගණනය වෙත දන්වා තිබුණු අතර එම වාහන ආරක්ෂක අමාත්‍යාංශයේ පාලන අංශය විසින් භාරගෙන නොමැති බවත්, එම වාහන ආරක්ෂක අමාත්‍යාංශයේ පාලන අංශයේ ප්‍රවාහන සංචිතය තුළ, ආරක්ෂක අමාත්‍යාංශයේ රාජකාරි සඳහා අනුයුක්ත කරගත් වාහන නොවන බවත් වාර්තා කර තිබීම හේතුවෙන් වාහන භාවිතයේදී රාජ්‍ය වියදම් කළමනාකරණය නිසි අයුරින් සිදුවූ බවට නිරීක්ෂණය නොවීය.	විශේෂ ආරක්ෂක රාජකාරී සඳහා සහ බුද්ධි රාජකාරී සඳහා යොදවනු ලබන වාහන සම්බන්ධයෙන් ප්‍රවාහන අංශය ඇතුළු සියලුම අංශ දැනුවත් කිරීමේ හැකියාවක් නොමැති අතර අවස්ථානුකූලව යුධ හමුදාව වැනි ආයතන වෙතින් මෙලෙස වාහන අනුයුක්ත කර ගෙන භාවිතා කිරීම සංකීර්ණ ආරක්ෂක හා මූලෝපායික අවශ්‍යතාවයන් හේතුවෙන් සිදුවී ඇත.	වෙනත් ආයතනවලට අයත් වාහන අවිධිමත්ව උපයෝජනය කිරීම වැලකෙන පරිදි 2017 දෙසැම්බර් 21 දිනැති චක්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 2/2017 අනුව ලියාපදිංචි අයිතිය නොමැතිව පරිහරණය කරන වාහන ලියාපදිංචි ඇති ආයතනයේ එකඟතාවය මත තම ආයතනය නමින් ලියාපදිංචි කර ගැනීම සිදුකළ යුතුය.
(ආ)	2017 දෙසැම්බර් 21 දිනැති චක්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 2/2017 අනුව වාහන ලියාපදිංචි ඇති ආයතනයේ එකඟතාවය මත තම ආයතනය නමින් ලියාපදිංචි කර ගැනීම හෝ පවරාදීම සිදුකළ යුතු වුවත් එවැනි පවරා ගැනීමකින් තොරව යුද්ධ හමුදාවට අයත් අංක KG-0349, CAF-1086 හා CAF-1094 දරන වාහන අමාත්‍යාංශය විසින් භාවිතා කර තිබුණු බව නිරීක්ෂණය වූ අතර ඒ සඳහා යුධ හමුදා වැය විෂයන් යටතේ ඉන්ධන ද ලබාගෙන තිබුණි.	ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ආරක්ෂක අමාත්‍ය ධූරයට පත් කර ඇති ජනාධිපතිවරයාගේ විධානය යටතේ රටේ ජාතික ආරක්ෂාව විෂයෙහි අත්හල නොහැකි හා ලිහිල් කල නොහැකි භාරදූර වගකීමක් ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්වරයා වෙත අමාත්‍යාංශ විෂය පථය නිර්ණය කිරීමේ ගැසට් පත්‍ර හා එහි සඳහන් පනත් මගින් පැවරී ඇති වගකීම අනුව අවශ්‍යතාවය පරිදි අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල සම්පත් රාජකාරීමය අවශ්‍යතා සඳහා භාවිතා කර ඇති බව.	වෙනත් ආයතනවලට අයත් වාහන අවිධිමත්ව උපයෝජනය කිරීම වැලකෙන පරිදි 2017 දෙසැම්බර් 21 දිනැති චක්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 2/2017 අනුව ලියාපදිංචි අයිතිය නොමැතිව පරිහරණය කරන වාහන ලියාපදිංචි ඇති ආයතනයේ එකඟතාවය මත තම ආයතනය නමින් ලියාපදිංචි කර ගැනීම සිදුකළ යුතුය.

(ඇ)	හමුදා සම්බන්ධතා නිලධාරී කාර්යාලය හා ආරක්ෂක ලේකම් කාර්යාලය ඇතුලු ආරක්ෂක අංශ සඳහා පිළිවෙලින් වාහන 27 ක් හා 13 ක් වෙන්කර තිබුණු නමුත් එම වාහනය භාවිතා කළ අය හා ධාවනය කළ කාරණය දැක්වෙන පරිදි ධාවන සටහන් පවත්වා නොතිබුණි. එම වාහන භාවිතා කර ඇත්තේ නිල වාහන අනුයුක්ත කරනු ලැබීමට අවසර ඇති නිලධාරීන්ද යන්න හෝ දැනටමත් එම පහසුකම නිත්‍ය සේවා ස්ථානයෙන් (ත්‍රිවිධ හමුදාවෙන්) ලබාගෙන ඇත්ද යන්න තහවුරුකළ නොහැකි විය.	සාමාන්‍ය රජයේ කාර්යාලයක මෙන් කාර්යාල වේලාවන් තුළ පමණක් මෙම අමාත්‍යාංශයේ රාජකාරි කටයුතු සිදු නොවන බැවින් මෙම වාහන වෙන්කර ඇති අතර ආරක්ෂක හේතූන් මත රහස්‍ය හෝ බුද්ධිමය රාජකාරි පිළිබඳව ධාවන සටහන් මගින් අනාවරණය කළ නොහැකි බව.	මුදල් රෙගුලාසි 1645 සහ 1646 ප්‍රකාරව මාසික ධාවන සටහන් පිළියෙල කර ඉදිරිපත් කළයුතු අතර 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව එම වාහන භාවිතා කර ඇත්තේ නිල වාහන අනුයුක්ත කරනු ලැබීමට අවසර ඇති නිලධාරීන්ද යන්න හෝ දැනටමත් එම පහසුකම නිත්‍ය සේවාස්ථානයෙන් (ත්‍රිවිධ හමුදාවෙන්) ලබාගෙන ඇති නිලධාරීන්ද යන්න තහවුරුකර ගත යුතුය.

3.6 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කිසියම් නිශ්චිත කාර්යයක් සඳහා මාණ්ඩලික නිලධාරියකු වෙත රු 100,000 ක උපරිමයකට යටත්ව තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබා දිය හැකි අතර එම නිලධාරියා විසින් අදාල කාර්ය නිම කල විගසම අග්‍රිමය පියවිය වීමට කටයුතු කල යුතු වුවත් අවස්ථා 106 කදී විවිධ කාර්යයන් සඳහා ලබා දී තිබූ රු. 4,951,582 ක් වූ අත්තිකාරම් මුදල් පියවීමේදී දින 12 සිට දින 128 දක්වා කාල පරාසයක ප්‍රමාදයක් පැවති බව නිරීක්ෂණය විය.	අභ්‍යන්තර චක්‍රලේඛ උපදෙස් නිකුත් කර නොපියවූ අත්තිකාරම් කඩිනමින් අයකර ගැනීම විධිමත් කර ඇත.	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (2) (ආ) හි සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර අදාල කාර්ය නිම කල විගසම අග්‍රිමය පියවීමට කටයුතු කල යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ජාතික සහන සේවා මධ්‍යස්ථානය විසින් නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය යටතේ නිවාස 5,025 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. ඉන් නිවාස 4,898 ක වැඩ ආරම්භ කර	නිවාස ඉදිකිරීම් ආරම්භ කර අතහැර දමා ඇති ප්‍රතිලාභීන් සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව උපදෙස් මාලාවක් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ලබාදී ඇති බව සහ එලෙස ඉදිකිරීම්	අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා ගැනීමට කටයුතු කළ යුතුයි.

	තිබූ නමුත් නිවාස 1,179 ක ඉදිකිරීම් අතහැර දමා තිබුණු අතර නිවාස 127 ක ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි.	අතහැර දැමූ ප්‍රතිලාභීන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීම සඳහා නෛතික ප්‍රතිපාදන නොමැති බව.	
(ආ)	නැවත පදිංචි කිරීමේ නිවාස ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂය අවසන් වනවිට රු.මිලියන 583.83 ක් වැය කර තිබුණු නමුත්, යටිතල පහසුකම් නොමැතිවීම සහ අවදානම් සහගත ස්ථානවලින් පදිංචිකරුවන් ඉවත්වීම ප්‍රතික්ෂේප කිරීම යනාදී හේතුමත ඉදිකල නිවාසවල පදිංචි නොවීමේ තත්වයක් නිරීක්ෂණය විය.	2024 හා 2025 වර්ෂවලදී යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා පිලිවෙලින් රු. මිලියන 79 ක් හා රු. මිලියන 50.6 ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත නිදහස් කර ඇති අතර නැවත පදිංචි කිරීමේදී ඇති වූ ප්‍රායෝගික ගැටලු සඳහා විසඳුම් ඇතුලත් මාර්ගෝපදේශය ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශ සඳහා යොමුකර ඇති බව.	අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා ගැනීමට කටයුතු කළ යුතුයි.

4.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 5.4.10 (ඇ) අනුව ඇස්තමේන්තු ගත කොන්ත්‍රාත් මුදලින් සියයට 10 කට නොඅඩු කාර්යසාධන සුරක්ෂණයක් ලබාගත යුතු වුවද ත්‍රිවිධ හමුදාව සඳහා ආහාර ද්‍රව්‍ය ප්‍රසම්පාදනයේදී කාර්යසාධන සුරක්ෂණය කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 05 ක් ලෙස සංශෝධනය කර ගිවිසුම්වලට එළඹ තිබුණු අතර එක් එක් හමුදාවන්ට අදාල කාර්යසාධන සුරක්ෂණ විවිධ අනුපාතයන් යටතේ දක්වා තිබුණි. මේ හේතුවෙන් ලංසු කරුවන් තුළ ව්‍යාකූලතාවක් ඇතිවීමටත්, ලංසු ලේඛණ පරස්පර අදහස් සහිත වීමටත් හැකියාව පැවතුණි.	2026 වර්ෂය සඳහා ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ උපදෙස් පරිදි උචිත ක්‍රමවේදයක් අනුගමනය කිරීමට කටයුතු කරන බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පරිදි සැපයුම් කාර්යසාධනය අසාර්ථක වීමකදී ප්‍රසම්පාදන අස්ථිත්වය වෙත ප්‍රමාණවත් සුරක්ෂණයක් ලැබෙන පරිදි කටයුතු කළ යුතුය.
(ආ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.9.1 ප්‍රකාරව ලංසුකරු වෙත වහාම විධිමත් ප්‍රතිග්‍රහණ ලිපියක් නිකුත් කර ඒ සමගම විධිමත් කොන්ත්‍රාත් ගිවිසුම් ලියා අත්සන් කළයුතු වුවද, ආහාර ප්‍රසම්පාදනයේදී ලංසු ප්‍රදානය කිරීමෙන් දින 47 සිට 86 දක්වා කාලයක් ප්‍රමාදව ත්‍රිවිධ හමුදා විසින් ගිවිසුම් ගතවීම සිදුකර තිබුණි.	එබැවින් මින් ඉදිරියට නියමිත කාලය ඉක්මවීමට පෙර ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කරන ලෙස ත්‍රිවිධ හමුදාව දැනුවත් කිරීම් සිදුකිරීමට කටයුතු කරමින් පවතින බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රතිග්‍රහන ලිපිය නිකුත්කරන අවස්ථාවේම විධිමත් ගිවිසුමක් අත්සන් කිරීමට කටයුතු කල යුතුය.

(ඇ)	ත්‍රිවිධ හමුදාවන් සඳහා අමු හා වියළි ආහාර සැපයීම පිළිබඳ ප්‍රසම්පාදනයට අදාලව ඉදිරිපත් කෙරෙන ලංසු කොන්දේසිවල දැක්වෙන, ලංසු කරුවන්ගේ පූර්ව සුදුසුකම් පිළිබඳ නිර්ණායක, නිෂ්පාදකයාගේ අධිකාරිත්ව සහතික ඉදිරිපත් කිරීම, දක්වා ඇති සන්නම් නාම යටතේ මිලගණන් කැඳවීම හා සාම්පල ඉදිරිපත් කිරීම, එළවළු පළතුරු ආදිය සඳහා තත්ත්ව සහතික ඉල්ලීම ආදිය සම්බන්ධයෙන් දක්වා ඇති ලංසු කොන්දේසිවල පැවති දුර්වලතා හේතුවෙන් ප්‍රසම්පාදනයේ තරඟකාරිත්වය ප්‍රවර්ධනය අවම වීමටත්, ඉදිරිපත්වන මිල ගණන් ඉහලයාමටත් හේතුවී ඇති බව නිරීක්ෂණය විය.ත්‍රිවිධ හමුදාවේ කඳවුරු 147 ක් සඳහා, විවිධ ආහාර කාණ්ඩ 217 කට අදාල සැපයුම් අවස්ථා 2,088 ක් පමණ පැවතියද, තරගකාරීත්වය සීමිත වීම මත සැපයුම්කරුවන් 24 ක් විසින් සියළුම සැපයුම් අවස්ථා හිමිකරගෙන තිබුණි.	ප්‍රසම්පාදන අස්ථිත්වය ලෙස ලංසු ඇගයීම් කමිටුවට සහ ත්‍රිවිධ හමුදාව වෙත ලංසු කරුවන්ගේ පූර්ව සුදුසුකම් පිළිබඳ නිර්ණායක ලිහිල් කරන මෙන් දැනුවත් කිරීම් සිදු කර ඇති බව.	ප්‍රසම්පාදනයේ තරඟකාරිත්වය උපරිම වන පරිදි සුදුසුකම් ලත් උනන්දුවක් දක්වන සියළු පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගී වීම සඳහා සාධාරණ, සමාන හා උපරිම අවස්ථා ලැබෙන පරිදි ලංසු කොන්දේසි පැනවිය යුතුය.
(ඈ)	2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව 2020 ජනවාරි 01 සිට සියළුම රාජ්‍ය ආයතන විසින් වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය (Shopping Method) යටතේ සිදුකරනු ලබන ප්‍රසම්පාදන, රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමවේදයට අනුගතව (e-GP system) සිදුකළයුතු වුවත්, ජාතික ශිෂ්‍යභට බලකාය විසින් යොමුගත චක්‍රලේඛය අනුකූලව කටයුතු කර විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතියේ (www.promise.lk) ලියාපදිංචි වීම, සම්බන්ධීකාරක නිළධරයකු නම්කිරීම, (Liaison Officer) ප්‍රසම්පාදන සැලැස්ම හා ප්‍රසම්පාදන දැන්වීම් ආදිය පද්ධතියට උඩුගත කිරීම හෝ සැපයුම් කරුවන් දැනුවත් කිරීම ආදී කාර්යයන් සිදුකර නොතිබුණි.	රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය පරිදි විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතියේ (www.promise.lk) ලියාපදිංචි වීමට හා සම්බන්ධීකාරක නිළධරයකු නම්කිරීම කටයුතු කරන බව.	රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය පරිදි රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමවේදයට අනුගතව කටයුතු කළ යුතුය.
(ඉ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3 ප්‍රකාරව සම්මත ලංසු ලියවිලි වල ආදර්ශයන් දක්වා ඇති අතර, අවශ්‍ය නම් අවම වෙනස්කම් සහිතව එම සම්මත ලංසු ලියවිලි භාවිතා කල යුතු වුවද ජාතික ශිෂ්‍ය බට බලකාය විසින් 2024 වර්ෂයේදී සිදු කර තිබුණු රු. 127,147,840 ප්‍රසම්පාදනයන්	නිශ්චිත පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පරිදි අවම වෙනස්කම් සහිතව සම්මත ලංසු ලියවිලි භාවිතා කල යුතුයි.

	සඳහා සම්මත ලංසු ලියවිලි භාවිතා කර නොතිබුණි.		
(ඊ)	76 වන නිදහස් උත්සවය සඳහා දුඹුරු බූට් යුගල 300 ක් මිලදී ගැනීම සඳහා වූ රු. 3,876,300 ක ප්‍රසම්පාදනය වෙනුවෙන් රු. 328,500 කාර්යසාධන ඇපකර ඉදිරිපත්කරන ලෙස දන්වා ඇතත්, සැපයුම්කාර ආයතනය විසින් ඉදිරිපත් කළ ලිපියක් පිළිගනිමින් කාර්යයසාධන ඇපකර රහිතව කටයුතු කිරීමට අනුමැතිය ලබාදී තිබුණි.	සැපයුම්කාර ආයතනය විසින් කාර්යයසාධන ඇපකර රහිතව කටයුතු කිරීමට කළ ලිඛිත ඉල්ලීම සඳහා ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබාදී ඇති බව.	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 5.4.10 අනුව, කොන්ත්‍රාත්තුවේ කාර්යසාධනය අසාර්ථක වන විට එයින් ප්‍රසම්පාදන අස්තිත්වය ආරක්ෂා කිරීම සඳහා ඇස්තමේන්තු ගත කොන්ත්‍රාත් මුදලින් සියයට 10 කට අඩු නොවන සුරක්ෂණයක් මගින් වගකීම් පිළිබඳ බැඳීම් ආවරණය කර ගනු ලැබිය යුතු වේ.
(උ)	අමාත්‍යාංශය විසින් ලියාපදිංචි කර තිබුණු සැපයුම්කරුවන්ගේ ලේඛණය පිළිබඳ නියැදි පරික්ෂාවකදී, එකම පුද්ගලයකු හිමිකාරත්වය දරන ආයතන කිහිපයක් එක් සැපයුම් කාණ්ඩයකට අයත් භාණ්ඩ සැපයීම සඳහා ලියාපදිංචි කර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. මේ අනුව යම් ප්‍රසම්පාදනයකදී, එක් සැපයුම්කරුවකු හට, ආයතන කිහිපයක නමින් ලංසු ඉදිරිපත් කිරීමට හැකියාව ලැබී තිබුණු බැවින් තරඟකාරී මිලගණන් ඉදිරිපත්වීම වැළකී තිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	ව්‍යාජ තරගකාරිත්වයන් ඇති නොවන පරිදි ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලේඛනය පවත්වා ගැනීමට කටයුතු කළ යුතුයි.

4.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම**	**නිර්දේශය**
අමාත්‍යංශයට අයත් තක්සේරු වටිනාකම රු.මිලියන 12 ක්වූ අංක KC-2275 දරන ඩිෆෙන්ඩර් වර්ගයේ රථය 2021 දෙසැම්බර් මාසයේදී අළුත්වැඩියාවට යොමුකර ඇතත්, 2024 දෙසැම්බර් වන විටත් අළුත්වැඩියාව නිමකර රථය ආපසු ලබාගැනීමට නොහැකිව තිබුණු අතර රථයේ පැවැත්ම හා ආරක්ෂාව සම්බන්ධයෙන් ගැටළු සහගත තත්ත්වයක් පැවතුණි.	මෙම රථයේ අළුත්වැඩියාව අසාර්ථකවීම හේතුවෙන් නීතිමය ක්‍රියාමාර්ග හරහා වන්දි ලබාගැනීමට කටයුතු කරමින් පවතී.	වත්කම්වල ආරක්ෂාව හා පැවැත්ම සම්බන්ධයෙන් ප්‍රමාණවත් විධිවිධාන සැලැස්විය යුතුය.

4.4 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආරක්ෂක මූලස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතිය විසින් වැලි කියුබ් 1,530 ක් මිලදීගැනීම සඳහා රු. 1,057,700 ක් ත්‍රිකුණාමලය දිසා වන කාර්යාලය වෙත ගෙවීම් කර තිබියදී එම වැලි තොගයෙන් කියුබ් 1,209 ක් නාවික හමුදාව විසින් භාවිතා කර ඇති බව අනාවරණය වී තිබුණි. මෙම මුදල නාවික හමුදාවෙන් ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කරනු ලබන බවට, 2022 වර්ෂයේ වාර්තා කර තිබූ නමුත් නිරවුල් කළ බවට තහවුරු නොවුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	නාවික හමුදාව විසින් කුමන කාර්යයකට මෙම වැලි තොග භාවිතා කර ඇත්ද යන්න තහවුරු කර ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සිදු කළ යුතුයි.
(ආ)	2021 වර්ෂයේදී අමාත්‍යාංශයේ පරිභෝජ්‍ය ද්‍රව්‍ය ගබඩාවේ හඳුනාගෙන තිබුණු රු. 16,769,458 ක භාණ්ඩ ඌනතාවක් සම්බන්ධයෙන් කමිටු වාර්තා කැඳවා තිබූ නමුත් ගබඩාභාරකරුගේ මාසික වැටුපෙන් සියයට 25 ක් හෙවත් රු.9,207 ක මුදලක් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගැනීම හැරුණුවිට මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කිරීම වර්ෂ 04 ක සිට ප්‍රමාද වෙමින් පැවතුණි.	මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීම සඳහා පරීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇති අතර, එම වාර්තාව ලැබීමෙන් අනතුරුව ඉදිරි කටයුතු සිදු කරන බව හා මෙවැනි සිදුවීම් වැලැක්වීමේ පාලන පිළිවෙත් හඳුන්වාදීමට කටයුතු කළ බව.	අප්‍රමාදව මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කළ යුතුය.

4.5 අනාර්ථික ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රාජ්‍ය වියදම් ඉතාම අත්‍යවශ්‍ය සේවාවන් සඳහා පමණක් යොදාගැනීමටත්, ගොඩනැගිලි ඉදිකිරීම හා කුළියට ගැනීම ආදී වියදම් සිදු නොකළයුතු බවත්, අරපිරිමැසුම්දායි ලෙස රජයේ වියදම් දැරිමත් සිදුකළ යුතු බව අවධාරණය කර ඇතත්, ජාතික ආරක්ෂක විද්‍යායතනය සඳහා සතියේ දිනයන්හි සාමාන්‍ය කාර්යාල වේලාවන් තුල පවත්වා තිබුණු පාඨමාලාවක විද්‍යාර්ථීන්ට නවාතැන් පහසුකම් සැපයීම සඳහා රු. 34,518,000 ක වාර්ෂික බදුකුලී ගිවිසුමක් මත ගෘහ ඒකක 37 ක් ලබාගෙන තිබුණි. එමෙන්ම මුදල් රෙගුලාසි 835 හා 2024	දේශන සතියේ දිනයන්හි කාර්යාල වේලාවන් තුළ පැවැත්වුවද, ජාත්‍යන්තරව පිළිගත් නියාමනයන් අනුව නේවාසිකව පාඨමාලාවන් පැවැත්වීම අවශ්‍ය වන අතර කළාපීය රාජ්‍යයන් හා ඇමරිකාව ඇතුළු සංවර්ධිත රාජ්‍යයන් වල ක්‍රියාත්මක ආකෘතියට අනුව පවත්වාගත යුතුවීමත් හමුදා නිලධරයන් බඳවාගැනීමේ කොන්දේසි අනුව නේවාසික පහසුකම්	රාජ්‍ය වියදම් පාලනය සම්බන්ධයෙන් නිකුත්කර ඇති අංක 03/2022,අංක 2/2023 හා අංක 1/2024 දරණ ජාතික අයවැය චක්‍රලේඛවල සඳහන් වියදම් දැරිමත්,වියදම් අවම කිරිම සඳහා වන රෙගුලාසි හා උපදෙස් පිළිපැදිය යුතුය.

	ජනවාරි 10 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 හි 7.4 ප්‍රකාරව භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබාගැනීමට පෙර ලංසු ප්‍රදානය හා ගිවිසුම්ගතවීමද සිදුකර තිබුණි.	සැපයියයුතු වීමත් හේතුවෙන් ගොඩනැගිලි කුලියට ගැනීමට සිදුවූ බව.	
(ආ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9 (ආ) අනුව ලංසු ඇගයීම, ලංසු කැඳවීමේ ලේඛණවල සඳහන් කර ඇති ක්‍රමය, නියමයන් සහ කොන්දේසි වලට අනුකූලව සිදුවිය යුතු වුවත් ගොඩනැගිල්ලක් කුලියට ගැනීමට සැපයුම්කරු ඉදිරිපත්කළ ලංසු ලේඛණ අනුව කුලී අත්තිකාරම් මුදලක් පිළිබදව සඳහන් කර නොතිබුණු නමුත් ලංසු ප්‍රදානය කිරීමෙන් අනතුරුව ලංසුකරුගේ ඉල්ලීම මත මාස 06ක අත්තිකාරම් වශයෙන් රු.17,259,000 ලබා දී තිබුණි.	ලංසු කැදවන වටත් පාඨමාලාව ආරම්භකර තිබුණු බැවින් ලංසු කැඳවීමේ ලේඛණවල සඳහන් කර ඇති කොන්දේසි වලින් බැහැරව ගිවිසුම්ගත වීමට සිදුවූ බව.	ලංසු ඇගයීම, ලංසු කැඳවීමේ ලේඛණවල සඳහන් කර ඇති ක්‍රමය, නියමයන් සහ කොන්දේසි වලට අනුකූලව සිදුවිය යුතු අතර රජයේ තක්සේරු වාර්තාවක්ද ලබාගත යුතුය.

4.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2015 ජූලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 1/2015 හි (05) ඡේදයේ සහ මුදල් රෙගුලාසි 128 (2)(එ) හි විධිවිධානවලට අනුව, ආර්ථික තත්ත්වයේ වෙනස්කම් සැලකිල්ලට ගනිමින්, අවශ්‍ය විටෙක විවිධ සේවාවන් සඳහා අය කරනු ලබන ගාස්තු කාලෝචිත ලෙස සංශෝධනය කළ යුතු වුවත්, 1996 අංක 22 දරන තුවක්කු (සංශෝධන) පනත යටතේ අයකරනු ලබන ගාස්තු කාලීනව සංශෝධනය කිරීම තවදුරටත් ප්‍රමාද වෙමින් පැවතීම හා දැනට ක්‍රියාත්මක ගාස්තු සලකා බැලීමේදී ඉතාම අවම වාර්ෂික ගාස්තුවක් ක්‍රියාත්මක වන බැවින් වර්ෂ 29 කට ආසන්න කාලයක් තුළ ගාස්තු සංශෝධනය නොකිරීම හේතුවෙන් සැලකිය යුතු රාජ්‍ය ආදායමක් වාර්ෂිකව අහිමිවන බව.	1996 අංක 22 දරණ තුවක්කු (සංශෝධන) පනත මඟින් නියම කර ඇති බලපත්‍ර ගාස්තු සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, ඉදිරි කටයුතු සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත 2025.05.08 වන දින යොමුකර ඇත.	අප්‍රමාදව ගාස්තු සංශෝධනය කිරීම තුලින් ආදායම් අහිමිවීම වලක්වා ගත යුතුයි.
(ආ)	තුවක්කු බලපත්‍ර ආඥාපනතේ 182 අධිකාරයෙහි 27 වන ඡේදය ප්‍රකාරව බලපත්‍ර අධිකාරීවරයා විසින් තුවක්කු සම්බන්ධයෙන් “අ” උපලේඛණයෙහි “ග” ආකෘතියට සාරානුකූලව සියලුම තුවක්කු බලපත්‍ර පිළිබඳ ලේඛණයක් පවත්වා ගත යුතු අතර එම ලේඛණ අනුව 1995	වගා ආරක්ෂක හා දේපල ආරක්ෂාව සඳහා නිකුත් කර තිබූ ගිනිඅවි සංඛ්‍යාව දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන ගිනිඅවි පිළිබඳ	ලේඛණ අතර විෂමතාවන් පිළිබඳව නිසි පරීක්ෂාවන් සිදුකර නිවැරදි ලේඛණ පවත්වාගත යුතුයි.

වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දක්වා කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන (වගා ආරක්ෂක සහ දේපළ ආරක්ෂාව සඳහා) කාර්යන් සඳහා නිකුත්කර තිබුණු බලපත්‍ර සංඛ්‍යාව 25,064 ක් ලෙස වාර්තාගතව ඇතත්, විගණනට ඉදිරිපත් කළ 2024 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාල අනුව ගිණි අවි බලපත් සංඛ්‍යාව දැක්වෙන ලේඛණය අනුව බලපත්‍ර 12,981 ක වෙනසක් පැවතුණි.	සවිස්තර වාර්තාවක් ගෙන්වා ගැනීමට හා නිවැරදි ගණනයන් ලබා ගැනීමට කටයුතු කරන බව.	

5. **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ආරක්ෂක අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආපදා කළමනාකරණ අංශය හා සෙසු ආයතන 06 ක් වෙත ත්‍රිවිධ හමුදා නිළධාරීන් හා සෙසු නිලයින් 647 ක් අනුයුක්ත කර ඇතත් එම කාර්යමණ්ඩලය යෙදවීම සඳහා වූ අනුමැතිය පිළිබඳ තොරතුරු අනාවරණය නොවුණි.	පිළිතුරු ලබාදී නොතිබුණි.	නිශ්චිත අනුමැතිය සහිත ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් පවත්වාගත යුතුය.